දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

47944

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/05-01-02/07/2019

ඔබේ අංකය / உமது இல. / Your No.: MF1/02/01/CUS/24(T) DC/ DDC/SC

දිනය / திகதி / Date: 2021.03. 10

BY HAND

15 MAR 2021

12 MAR 2021

ලේකම්
මුදල් අමාත්‍යාංශය

**<u>ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ රේගු සේවයේ විධායක සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය (සංශෝධිත)</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2021.02.18 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2021.03.08 දින සහතික කරන ලද, මෙම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණිය (SL-01) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ මුල් පිටපත මේ සමග එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පටිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ආර්.ඩී.පී.එස්.ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්:

1. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව - මුල් පිටපත අමුණා ඇත
2. රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව - මුල් පිටපත අමුණා ඇත
3. .ආයතන අධ්‍යක්ෂ ජනරාල් - මුල් පිටපත අමුණා ඇත

(අමාත්‍ය මණ්ඩලය විසින් 2009.12.09 දිනැතිව අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටියට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2020.02.13 දින දක්වා අනුමත කරනු ලැබූ සංශෝධනයන් ඇතුලත් කර සකස් කරනු ලැබූ සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය)

## <u>ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ</u>

## <u>විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය</u>

**01.** සම්බන්ධවන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා රේගු යොමු අංකය: ඒබී/2ඒ/2/24(III ) දිනය : 2009.04.02

යොමු අංකය: ඒබී/2ඒ/224(VII ) දිනය: 2019.10.02

1.2 අමාත්‍යාංශය : මුදල් යොමු අංකය: එම්එෆ්1/4/සීයූඑස්/63 දිනය : 2009.04.08

යොමු අංකය: MF1/02/01CUS/24(T)-DC/DDC/SC දිනය : 2019.10.24

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :

යොමු අංකය : DMS/C/4/FP/09S&C දිනය : 2008.07.07

යොමු අංකය : DMS/1173-lll දිනය : 2018.12.11

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය

යොමුඅංකය : EST-3/RECRU/02/22/52 දිනය : 2008.11.17

යොමුඅංකය : EST-2/04/REC/10029 දිනය : 2019.09.17

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය: NSCC/2/3/3/රේගු/3/16 දිනය : 2008.11.19

යොමු අංකය: NSCC/01/07/41/SR දිනය : 2019.07.22

1.6 අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය:

යොමු අංකය: අමප./09/2798/306/169 දිනය : 2009.12.09

යොමු අංකය: අමප./14/0709/504/079 දිනය : 2014.07.03

1.7 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:

යොමු අංකය: PSC/EST/7/1/2/1/2012 දිනය : 2014.10.14

යොමු අංකය: PSC/EST/05-01-02/07/2019 දිනය : 2020.02.13

02. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : විධායක

3.2 ශ්‍රේණි : III, II හා I

3.3. පැවරෙන කාර්යය භාරය පිළිබඳ පොදු නිර්වචනය:

පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සම්පාදනය, විධානය/අණ දීම, කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වූ ද ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ථ කාර්ය භාරයේ අන්තර්ගත කාර්යයන් අතරින් තනතුර නිශ්චිත කොට පවරා දෙනු ලබන කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

3.4. කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය: ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

05. වැටුප්

5.1. වැටුප් කේත අංකය : SL- 01 – 2016

5.2. වැටුප් පරිමාණය : රු 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17x 2,170 - 110,895/-

5.3. ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාල මාසික වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු :) | |
|---|---|---|---|
| III | පියවර 01 | 47,615/- | |
| II | පියවර 12 | 62,595/- | |
| I | පියවර 20 | 76,175/- | |
| I | පියවර 23 | 82,685/- | |

**06.** සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| රේගු අධ්‍යක්ෂ | I | 16 | ඇමුණුම 01 බලන්න |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | I | 85 | ඇමුණුම 02 බලන්න |
| ජ්‍යෙෂ්ඨ රේගු අධිකාරී/නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | II | 192 | ඇමුණුම 03 බලන්න |
| රේගු අධිකාරී/ සහකාර රේගු අධ්‍යක්ෂ | III | 376 | ඇමුණුම 04 බලන්න |

සටහන:

(i) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුර SL -01 වැටුප් ක්‍රමයේ I ශ්‍රේණියේ තනතුරක් වුවද එය ජ්‍යෙෂ්ඨත්වය පෙන්වීම සඳහා පමණක් ඇති කල නිල නාමයකි. ඒ අනුව නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරට අදාල කාර්ය භාරය වගකීම හා 11 ශ්‍රේණියේ තනතුරට අදාල ප්‍රතිලාභයන් එලෙසම මෙම තනතුර සඳහා පවතින නමුත් 1 ශ්‍රේණියේ තනතුර සඳහා වන ප්‍රතිලාභයන් හිමි නොවේ.

(ii) ඉහත නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරට අදාළ කාර්ය භාරය යනුවෙන් සඳහන් වන්නේ පෙර බඳවා ගැනීම් පරිපාටිය ප්‍රකාරව නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරට පැවරී තිබූ කාර්ය භාරයයි.

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව:

| | | |
|---|---|---|
| රේගු අධ්‍යක්ෂ | - | 16 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | - | 85 |
| ජ්‍යෙෂ්ඨ රේගු අධිකාරී/ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | - | 192 |
| රේගු අධිකාරී/ සහකාර රේගු අධ්‍යක්ෂ | - | 376 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III, II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

**07.** බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන්:

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ. |
| සීමිත | අදාළ නොවේ. |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම :

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.4.2 සුදුසුකම් :

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම්: අදාළ නොවේ

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.4.2.3 පළපුරුද්ද : නියෝජ්‍ය රේගු අධිකාරී තනතුරෙහි සේවය ස්ථිර කරන ලද නිලධාරියකු වීම

සටහන -:

1. රේගු අධිකාරී / සහකාර රේගු අධ්‍යක්ෂ තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කිරීම සඳහා ඉහත 7.4.2.3 හි දැක්වෙන අවශ්‍යතා සපුරා ඇති ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවකදී, එම පුරප්පාඩු නියෝජ්‍ය රේගු අධිකාරී තනතුර සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධාන අනුව නියෝජ්‍ය රේගු අධිකාරී තනතුරට උසස්වීමට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහ මෙම බඳවා ගැනීමේ පටිපාටියේ 7.4.2.3 හි දැක්වෙන අවශ්‍යතාවය හැර අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගෙන් 7.4.4. යටතේ සඳහන් විධිවිධාන අනුව සම්පූර්ණ කරනු ලැබේ.

7.4.2.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

i. තනතුරේ ස්ථිර කර තිබීම.
ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව නියමිත කාල සීමාව තුල විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව, සුදුසුකම් පරීක්ෂාකරනු ලබන දිනට පූර්වාසන්න වසර (05) තුළ කාර්ය සාධන ඇගයීම සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමක පවත්වා ගැනීම.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3 වයස : අදාළ නොවේ

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය :

රේගු අධිකාරී / සහකාර රේගු අධ්‍යක්ෂ තනතුරේ පවතින පුරප්පාඩු, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉහත 7.4.2 යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව සම්පූර්ණ කරනු ලැබේ.

සටහන:

1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විධායක සේවා ගණයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.
2. අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ඉල්ලුම් පත් යොමු කරනු ලබන සියළුම නිලධාරීන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
3. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පමණක් පරීක්ෂා කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු නොලැබේ)
4. විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු ඇතිවන දිනට සුදුසුකම් පරීක්ෂාකරනු ලබන අතර එදිනට සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් පුරප්පාඩු ඇතිවූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දැන්වීමක් මගින් අභ්‍යන්තරව අයදුම්පත් කැඳවීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පලකිරීම මගින්.

08. කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නොවේ.

09. භාෂා ප්‍රවීණතාව : අදාළ නොවේ.

## 10. ශ්‍රේණි උසස් කිරීම් :

### 10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව නියමිත කාල සීමාව තුළ විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.1.2. II ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ජ්‍යෙෂ්ඨ රේගු අධිකාරී/ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරු සඳහා II ශ්‍රේණියේ ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී, එම පුරප්පාඩු පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව සම්පූර්ණ කරනු ලැබේ.

i. සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට, රේගු අධිකාරී / සහකාර රේගු අධ්‍යක්ෂ තනතුරේ III ශ්‍රේණියේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන කාලයක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

ii. විධායක සේවා ගණයට අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ II ශ්‍රේණියට උසස්වීමට අදාළ (ඉහත 10.1.1.1) හි i හා iv යටතේ වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

iii. මේ යටතේ සම්පූර්ණ කිරීමට අපේක්ෂිත පුරප්පාඩු ප්‍රමාණය අනුව අනුමත කරනු ලබන සුදුසුකම් අයදුම් පත් කැඳවීමේ නිවේදනයට ඇතුලත් කරනු ලැබේ

*iv.* සියළු සුදුසුකම් පුරප්පාඩු ඇතිවී ඇති දිනට පරික්ෂා *කරනු ලැබේ.*

10.1.2.2. උසස් කිරීමේ ක්‍රමය

පුරප්පාඩු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉහත 10.1.2 යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව සම්පූර්ණ කරනු ලැබේ.

සටහන :

1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.
2. අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ඉල්ලුම් පත් යොමු කරනු ලබන සියළුම නිලධාරීන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
3. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පමණක් පරික්ෂා කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු නොලැබේ)
4. පුරප්පාඩු ඇතිවන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම ක්‍රියාත්මක කරනු ලැබේ.

10.2 **II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම**

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) I ශ්‍රේණියට පත්වීමට පෙර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පශ්චාත් උපාධි ආයතනයකින් අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය. 2006.01.01 දිනට පෙර සේවයට බඳවා ගත් නිලධාරීන් අතුරෙන් ඉහත දැක්වූ පශ්චාත් උපාධිය ලබා ගෙන නොමැති නිලධාරීන් රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලබන මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරනු ලබන රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලත් රේගු විෂයට අදාළ වචන 5000කට නොඅඩු නිබන්ධනයක් පිළිගනු ලැබීමෙන් මෙකී අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

සටහන:

නිබන්ධනය ඉදිරිපත් කිරීමේ සහනය ලබා දෙනු ලබන්නේ මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරන දින සිට වසර හතරක (4) කාලයක් සඳහා පමණි. බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරන දිනට පෙර නිබන්ධනය සඳහා අනුමැතිය ලබාගෙන ඇති නිලධාරීන් සඳහා නිබන්ධනය සඳහා අනුමැතිය ලබා දී ඇති දින සිට වසර (04)ක කාලයක් තුල නිබන්ධනය සම්පූර්ණ කිරීමේ කොන්දේසිය අදාල වේ.

නමුත් එම සහන කාලය ලබා දීමෙන් එම කාලය තුළ I පන්තියේ රේගු අධ්‍යක්ෂ තනතුරට උසස්වීමට සුදුසුකම් ලබන බවට අදහස් නොවන අතර නිබන්ධනය සම්පූර්ණ කළ බවට රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිපියක් නිකුත් කිරීමෙන් පසු පමණක් I පන්තියේ රේගු අධ්‍යක්ෂ තනතුරට උසස් වීමට සුදුසුකම් ලබනු ඇත.

(ii) සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හතක (07) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හතක් (07) ක් උපයාගෙන තිබීම.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව නියමිත කාල සීමාව තුල විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

(iv) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2.2. I ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ / රේගු අධ්‍යක්ෂ තනතුරු සඳහා I ශ්‍රේණියේ ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී, එම පුරප්පාඩු පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති විධායක සේවා ගණයේ II ශ්‍රේණියේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව සම්පූර්ණ කරනු ලැබේ.

i. සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට, ජ්‍යෙෂ්ඨ රේගු අධිකාරී / නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරේ II ශ්‍රේණියේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන කාලයක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

ii. විධායක සේවා ගණයට අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ I ශ්‍රේණියට උසස්වීමට අදාළ (ඉහත 10.2.1.1) හි i හා iii යටතේ වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

iii. මේ යටතේ සම්පූර්ණ කිරීමට අපේක්ෂිත පුරප්පාඩු ප්‍රමාණය අනුව අනුමත කරනු ලබන සුදුසුකම් අයදුම් පත් කැඳවීමේ නිවේදනයට ඇතුලත් කරනු ලැබේ

iv. සියලු සුදුසුකම් පුරප්පාඩු ඇතිවී ඇති දිනට පරීක්ෂා කරනු ලැබේ.

10.2.2.1. උසස් කිරීමේ ක්‍රමය

පුරප්පාඩු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉහත 10.2.2 යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව සම්පූර්ණ කරනු ලැබේ.

සටහන :

1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

2. අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ඉල්ලුම් පත් යොමු කරනු ලබන සියළුම නිලධාරීන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

3. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පමණක් පරීක්ෂා කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු නොලැබේ)

4. පුරප්පාඩු ඇතිවන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම ක්‍රියාත්මක කරනු ලැබේ.

## 11. තනතුරුවලට පත් කිරීම

### 11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරා ගනු ලබන ආකාරය |
|---|---|---|
| නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | විධායක සේවා ගණයේ II ශ්‍රේණියේ නිලධාරියකු වීම | II ශ්‍රේණියේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරියකු වීම | I ශ්‍රේණියේ සහ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරේ සේවය කරනු ලබන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව<br>සටහන :<br>1. මෙම පටිපාටිය අනුමත කළ දිනට නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරෙහි සේවය කරනු ලබන නිලධාරීන් එදින සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරට පත් කරනු ලැබේ.<br>2. එම නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමට අදාළ සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට I ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලබන අතර එම තනතුරේ ජ්‍යෙෂ්ඨතාවය ඉහත සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට ගණනය කරනු ලැබේ.<br>3. එම නිලධාරීන් රේගු අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම සඳහා සලකා බලනු ලබනුයේ I ශ්‍රේණියට උසස් කිරීමෙන් පසුව පමණි. |
| රේගු අධ්‍යක්ෂ | විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරියකු වීම | I ශ්‍රේණියේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරේ සේවය කරනු ලබන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව |

**12.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ පොදු කොන්දේසි : අදාළ නොවේ

**13.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන :

(i) අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය යනුවෙන් අදහස් කරනුයේ මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කොට ඇති කාර්යසාධන ඇගයීම් පරිපාටියයි. එහෙත් යම් නිලධාරියෙකුගේ විෂය සීමා ඉක්මවූ හේතුවක් මත කාර්යසාධන ඇගයීම් මට්ටම සාමාන්‍ය මට්ටමට පවත්වාගෙනයාමට අපොහොසත්වූ විට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිර්දේශයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(ii) "සක්‍රීය සේවා කාලය" යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

**14.** ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :

මෙම පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති SL-01-2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

| සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර සිටින ශ්‍රේණිය | අන්තර්ග්‍රහණය කරනු ලබන ශ්‍රේණිය |
|---|---|
| III වන ශ්‍රේණිය | III වන ශ්‍රේණිය |
| II වන ශ්‍රේණිය | II වන ශ්‍රේණිය |
| I වන ශ්‍රේණිය | I වන ශ්‍රේණිය |

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේවතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තන්ගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ම ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

**15.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධි විධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : ***මෙම සංශෝධනයන් අනුමත කරනු ලබන දිනට පෙර ආරම්භකර ඇති උසස් කිරීමේ කාර්යයන් මේ දක්වා අනුමතව පැවති විධිවිධාන අනුව ක්‍රියාත්මක විය යුතුය***

සකස් කළේ : අත්සන ..........................................
(විෂයභාර මාණ්ඩලික නිලධරයා)
නම : යුෂාන් තරංග අබේකෝන්
තනතුර : නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ(මානව සම්පත්)
දිනය : 2021.02.09

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

පරීක්ෂා කළේ: අත්සන ..........................................
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : තමරා ඩී. පෙරේරා
තනතුර: අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්(මානව සම්පත්)
දිනය : 2021.02.12

තමරා ඩී. පෙරේරා
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්
(මානව සම්පත් කළමනාකරණ)
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව
අංක 40, කෙළිඳ් වීදිය,
කොළඹ 11.

අත්සන : ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : විශ්‍රාමික මේජර් ජනරාල් ජී.වී. රවිප්‍රිය
තනතුර : රේගු අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 15/02/2021

නිල මුද්‍රාව : විශ්‍රාමික මේජර් ජනරාල් ජී. වී. රවිප්‍රිය
රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

යොමු අංකය : MF1/02/01CUS/24(T)-DC/DDC/SC

අමාත්‍ය මණ්ඩලය විසින් 2009.12.09 දිනැතිව අනුමත කරනු ලැබූ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ හි විධායක බඳවා ගැනීමේ පටිපාටියට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2020.02.13 දින දක්වා අනුමත කරනු ලැබූ සංශෝධනයන් ඇතුලත් කර සකස් කරනු ලැබූ සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................

නම : ..........................................

ලේකම්

මුදල් අමාත්‍යාංශය

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

දිනය : 2021/02/18

නිල මුද්‍රාව : ..........................................

---

යොමු අංකය : PSC/EST/05-01-02/07/2019

අමාත්‍ය මණ්ඩලය විසින් 2009.12.09 දිනැතිව අනුමත කරනු ලැබූ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2020.02.13 දින දක්වා අනුමත කරනු ලැබූ සංශෝධනයන් අනුව ගනු ලැබූ ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි සංශෝධනයන් ඇතුලත් කර සකස් කරනු ලැබූ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ හි විධායක සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය 2020.02.13 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........................................

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2021.03.08

නිල මුද්‍රාව : එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ඇමුණුම 1

<u>රේගු අධ්‍යක්ෂ තනතුරට පැවරෙන කාර්යයන්හි ස්වභාවය සහ වගකීම්</u>

රේගු අධ්‍යක්ෂ ශ්‍රී ලංකා රේගු සේවයේ එක් අංශයක ( Division) ප්‍රධානියා වේ. රේගු ආඥා පනත හා වෙනත් ආනුශාංගික පනත් යටතේ පැවරෙන නීතිමය බලතල ද, පරිපාලන හා මුදල් රෙගුලාසි අනුව පැවරෙන බලතල ද, ක්‍රියාත්මක කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන හා තම තනතුරට අදාල විෂය පථයට අයත්වන සියලුම කාර්යයන් සම්බන්ධව ඔහු අධිකාරිත්වය දරයි. රේගු සේවයේ මූලික අරමුණු සහ තමා අයත් වන පර්ෂදයේ මූලික අරමුණු (අදාල පරිදි) ඉටු කිරීමෙහි ලා එක් එක් අංශයනට පැවරෙන රේගු කාර්යයන් හා අදාල සේවාවන් මනාව අධීක්ෂණය කිරීම සහ මානව සම්පත් කළමනාකරණය රේගු අධ්‍යක්ෂගේ මූලික වගකීම වේ. මෙහිලා නිශ්චිත කාල සීමාවන් සඳහා රේගු සේවයෙහි සහ පර්ෂදයට අදාල උපාය මාර්ග සැලසුම් වලට අනුගතව අදාල අංශය සඳහා කාර්ය සාධන සැලැස්ම (Performance plan ) සැකසීම සහ ප්‍රගතිය වාර්තා කිරීම ඔහුගේ මූලික වගකීමක් වේ.

රේගු අධ්‍යක්ෂ වෙත පැවරෙන කාර්යයන් සහ වගකීම් වඩාත්ම නැඹුරු වනුයේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී සහ උපාය මාර්ග සැළසුම් කිරීමේදී රේගු අධ්‍යක්ෂ ජනරාල් හා / හෝ අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් ( අදාල පරිදි) වෙත සහාය වීම සඳහාය. එයට අනුගතව සහ කාර්ය සාධන සැළැස්මට අනුකූලව අංශයේ කටයුතු අධීක්ෂණය සහ මානව සම්පත් කළමනාකරණයේදී අදාළ ප්‍රතිපත්තිමය තීරණ, දෙපාර්තමේන්තු නියෝග / රෙගුලාසි සහ උපදෙස් මාලාවනට අනුකූලව තමා වෙත වගකියනු ලබන නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් එම වගකීම් ප්‍රායෝගිකව ඉටු කරනු (Operational Activities) ලබන බවට ඔහු වගබලා ගතයුතු වේ.

ඒ සඳහා අවශ්‍ය බලතල සහ පහසුකම් ලබාදිය යුතුය.

රේගු අධ්‍යක්ෂ තම කාර්යයන් සහ සේවාවෙහි ප්‍රගතිය සම්බන්ධව රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත හෝ අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ( අදාල පරිදි) වගකිව යුතු වේ .

ඇමුණුම 2

**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරට පැවරෙන කාර්යයන්හි ස්වභාවය සහ වගකීම්**

නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ ශ්‍රී ලංකා රේගු සේවයේ එක් ශාඛාවක ( Branch ) ප්‍රධානියා වේ. රේගු අඥා පනත හා වෙනත් ආනුශාංගික පනත් යටතේ පැවරෙන නීතිමය බලතල ද, පරිපාලන හා මුදල් රෙගුලාසි අනුව පැවරෙන බලතල ද, ක්‍රියාත්මක කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන හා තම තනතුරට අදාල විෂය පථයට අයත්වන සියලුම කාර්යයන් සම්බන්ධව ඔහු අධිකාරිත්වය දරයි. රේගු සේවයේ මූලික අරමුණු සහ තමා අයත් වන අංශයෙහි මූලික අරමුණු වලට (අදාල පරිදි) අනුගතව එක් එක් ශාඛාවනට පැවැරෙන රේගු කාර්යයන් හා අදාල සේවාවන් ඉටු කිරීමෙහිලා අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් හෝ රේගු අධ්‍යක්ෂට (අදාළ පරිදි) සහාය වීම ඔහුගේ මූලික වගකීම වේ.

මෙහිලා නිශ්චිත කාල සීමාවක් සඳහා ( පර්ෂදයට අදාල උපාය මාර්ග සැලසුම්වලට හෝ අංශයට අදාල කාර්යය සාධන සැලැස්මට අනුගතව) අදාළ ශාඛාව සඳහා කාර්ය සාධන සැළැස්ම (Performance plan ) හෝ ක්‍රියාකාරි සැලැස්ම (Action Plan) අදාල පරිදි සැකසීම සහ ප්‍රගතිය සැකසිම වාර්තා කිරීම ද ඔහුගේ මූලික වගකිමක් වේ. නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ, රේගු සේවයෙහි මෙහෙයුම් කටයුතු භාරව (Hand of Operational Activities) ක්‍රියා කරයි.

සාමාන්‍යයෙන් නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරුන් රේගු විමර්ශන කටයුතු අවසානයේ පැවැත්වෙන රේගු පරික්ෂණයන්හි (Customs inquires) පරික්ෂණ නිලධාරීන් (Inquiry Officers) ලෙස කටයුතු කරති.

ඔහු තම කාර්යයන් සහ සේවාවෙහි ප්‍රගතිය සම්බන්ධව අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් හෝ රේගු අධ්‍යක්ෂ වෙත (අදාළ පරිදි) වගකිව යුතු වේ. අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් හෝ රේගු අධ්‍යක්ෂ විසින් (අදාළ පරිදි) විෂය පථයට අයත් අනෙකුත් රාජකාරි පැවරීම මත ඒවා නිසියාකාරව ඉටු කිරීම ද ඔහුගේ වගකීම වේ.

ඇමුණුම 3

<u>නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (ජ්‍යෙෂ්ඨ රේගු අධිකාරි) තනතුරට පැවරෙන</u>

<u>කාර්යයන්හි ස්වභාවය සහ වගකීම්</u>

රේගු අධිකාරි ශ්‍රී ලංකා රේගු සේවයේ එක් ඒකකයක (Unit) ප්‍රධානියා වේ. රේගු අඥා පනත හා වෙනත් ආනුශාංගික පනත් යටතේ පැවරෙන නීතිමය බලතල ද, පරිපාලන හා මුදල් රෙගුලාසි අනුව පැවරෙන බලතල ද, ක්‍රියාත්මක කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන හා තම තනතුරට අදාල විෂය පථයට අයත්වන සියලුම කාර්යයන් සම්බන්ධව ඔහු අධිකාරිත්වය දරයි. රේගු සේවයේ මූලික අරමුණු සහ තමා අයත් වන ඒකකයෙහි මූලික අරමුණුවලට (අදාල පරිදි) අනුගතව එක් එක් ඒකකයට පැවරෙන රේගු කාර්යයන් හා අදාල සේවාවන් ඉටු කිරිම ඔහුගේ මූලික වගකීම වේ. මෙහිලා නිශ්චිත කාල සීමාවක් සඳහා අංශයට අදාල කාර්ය සාධන සැළැස්මට හෝ ක්‍රියාකාරි සැළැස්මට (අදාල පරිදි) අනුගතව අදාල ඒකකය සඳහා ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) සැකසීම සහ ප්‍රගතිය වාර්තා කිරීම ද ඔහුගේ මූලික වගකීමක් වේ.

රේගු අධිකාරි විසින් රේගු භාණ්ඩ ප්‍රකාශන අනුමත කිරිමේ ක්‍රියාවලියට සම්බන්ධ (Processing of Cusdecs) සියලු පියවර නිසියාකාරව සහ ප්‍රමාණවත් ලෙස සිදුකර ඇති බවට සැහිමකට පත්වීමෙන් පසුව එම ප්‍රකාශනයන් (Cusdecs) බදු අයකර ගැනීම හෝ ආපසු ගෙවීම (අදාල පරිදි) සඳහා අනුමත කෙරේ. රේගු අධිකාරින් රේගු කාර්යයන් සඳහා භාණ්ඩ පරික්ෂාවේදී තම නිර්දේශයන් අදාල නියෝග සඳහා නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයෙකු වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රේගු අධිකාරින් විසින් ගමන්බඩු නිශ්කාෂණ ක්‍රියාවලියට අදාලව ලබාදිය යුතු අනුමත තීරුබදු සහනයන් නිශ්චය කිරීම සහ අයකළ යුතු තීරුබදු සහ අනෙකුත් බදුවල ප්‍රමාණය නිර්ණය කරනු ලබයි. මඟීන් සහ මඟීන් කැටුව නොඑන ගමන් බඩු නිශ්කාෂණය කිරිමේදීත්, රේගු විමර්ශන, වැටලීම් හා නඩු මෙහෙයුම් කටයුතුවලදිත්, අනෙකුත් රේගුව සම්බන්ධ කාර්යයන්වලදීත් නියෝජ්‍ය රේගු අධිකාරිවරුන්ට, සහකාර රේගු අධිකාරිවරුන්ට සහ අනෙකුත් සහායක නිලධාරින්ට ඒ සඳහා අවශ්‍ය උපදෙස් සැපයිම හා සුපරික්ෂණය ද ඔහුගේ වගකීමකි.

රේගු අධිකාරිවරුන් රේගු ගමන් බඩු කාර්යාලයේ, නිවාරණ කාර්යාලයේ හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් නිශ්චය කරනු ලබන වෙනත් ස්ථානයක පවත්වාගෙන යනු ලබන සුරක්ෂිතාගාරවල තැන්පත් කරන ලද භාණ්ඩ පිළිබඳ භාරකාරිත්වය දරයි.

රේගු අධිකාරින් තම කාර්යයන් සහ සේවාවෙහි ප්‍රගතිය සම්බන්ධව නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරුන් වෙත වගකිව යුතුවේ. නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් විෂය පථයට අයත් අනෙකුත් රාජකාරි පැවරිම මත ඒවා නිසියාකාරව ඉටු කිරිම ද ඔහුගේ වගකීම වේ.

**ඇමුණුම 04**

**<u>රේගු අධිකාරී (සහකාර රේගු අධ්‍යක්ෂ) තනතුරට පැවරෙන</u>**

**<u>කාර්යයන්හි ස්වභාවය සහ වගකීම්</u>**

රේගු ආඥා පනත හා වෙනත් ආනුශාංගික පනත් යටතේ පැවරෙන නීතිමය බලතලද, පරිපාලන හා මුදල් රෙගුලාසි අනුව පැවරෙන බලතල ද ක්‍රියාත්මක කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් නියම කරනු ලබන හා තම තනතුරට අදාළ විෂය පථයට අයත් වන සියලුම කාර්යයන් සම්බන්ධව රේගු අධිකාරී අධිකාරීත්වයක් දරයි.

රේගු අධිකාරී තනතුරට පැවරෙන මූලික කාර්යයන් සහ වගකීම් වල ස්වභාවය මෙසේය.

රේගු භාණ්ඩ ප්‍රකාශන අනුමත කිරීමේ ක්‍රියාවලියේදී (Processing of CusDecs) සහ රේගු කාර්යයන් සඳහා භාණ්ඩ පරීක්ෂාවේදී භාණ්ඩ වර්ගීකරණය හා හඳුනාගැනීම (Classification of goods) මිල තක්සේරු කිරීම (Valuation of goods) නිපන් රටෙහි නිර්ණය කිරීම සහ ඊට අදාළ රීතීන් (Country of origin determination) භාණ්ඩ වල ප්‍රමිතීන් සහ බලපත්‍ර වල අවශ්‍යතාවය පිළිබඳව පරීක්ෂා කිරීම නියමිත බදු අනුපාතය අය කරන්නේද යන්න පිළිබඳව සුපරීක්ෂාකාරී වීම සහ නියමිත තීරු බදු අනුපාතයන්ට අනුව අය කිරීමට වග බලා ගැනීම මඟින් රේගු තක්සේරු නිලධාරියෙක් ලෙස සේවය කිරීම.

ඔහු තම වගකීම් සහ කාර්යයන් ඉටු කිරීමේදී නියෝජ්‍ය රේගු අධිකාරීන්ගේ සහ සහකාර රේගු අධිකාරීන්ගේ සහය ලබා ගනී.

රේගු අධිකාරී තම කාර්යයන් සහ සේවාවෙහි ප්‍රගතිය සම්බන්ධව නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ වෙත වගකිව යුතු වේ. නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් විෂය පථයට අයත් අනෙකුත් රාජකාරී පැවරීම මත ඒවා නිසියාකාරව ඉටු කිරීම ද ඔහුගේ වගකීම වේ.